# මුදල් අමාත්‍යාංශය
# ජාතික රක්ෂණ භාර අරමුදල
# රැකියා පුරප්පාඩු

මුදල් අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණ, මෝටර් රථ රක්ෂණය, සාමාන්‍ය රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර, දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. මෙම අරමුදල් මණ්ඩලය කෙටි කාලයක් තුළදී නව්‍යකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකිමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. සහකාර කළමනාකරු - නීති සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සේවා පළපුරුද්ද තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව අවම වශයෙන් වසර 05ක කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-2 - 2016 : රු.[54,550- 10 x 1,375 – 15 x 1,910 – 96,950]

**වයස :** අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම :** මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට සඳහා හිමිකම් ඇත.

## 03. ප්‍රසම්පාදන නිලධාරී

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය, වාණිජ, මූල්‍ය, අලෙවිකරණ, ගිණුම්කරණ, ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණය, සැපයුම් ජාල කළමනාකරණය හෝ කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1), II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** JM 1-1 - 2016: රු.[42,600- 10x755 - 18 x 1,135–70,580]

**වයස :** අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම :** මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

## 04. අනුකූලතා නිලධාරී

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, ව්‍යාපාර පරිපාලන, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ අධ්‍යයන හෝ නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳව කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (MA1), II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්ද තිබීම.

**වැටුප් පරිමාණය :** JM 1-1-2016: රු.[42,600- 10 x 755 - 18 x 1,135 - 70,580]

**වයස :** අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**පත්වීම :** මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**වෙනත් ප්‍රතිලාභ :**

- පූර්ණ වෛද්‍ය රක්ෂණාවරණයක් සඳහා හිමිකම් ඇත.
- වෘත්තිය සාමාජිකත්වය අලුත් කිරීම සඳහා අවශ්‍ය වාර්ෂික දායක මුදල් සඳහා අනුග්‍රාහකත්වය දක්වනු ලැබේ.

**කොන්දේසි :**

සියලුම අයදුම්කරුවන්,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

**අයදුම්කරුවන්,**

- ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතු වේ. දැනටමත් රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත එවිය යුතු වේ.
- අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කළ යුතුය.
- ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල, නො: 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2022.03.21 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- **පත්වීම් පිළිබඳ අවසන් තීරණය ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබේ.**

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**නො: 95,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**

Source: Silumina (2022.03.06)